# අපි ශ්‍රී ලාංකිකයෝ



සේහා විදානගමගේ

# අපි ශ්‍රී ලාංකිකයෝ

**සේහා විදානගමගේ**

කතෘගේ වෙනත් කෘති

My Poetry Collection

**ISBN: 978-624-208-431-2**

# පිදුම

**පෙර පාසැලේ සිට මේ දක්වා**

**මා හට සිප් සතර ලබා දුන් සියළුම**

**ගුරු මැණිවරුන් හා පියවරුන්ට**

**සහ**

**නිරතුරුව ඔවදන් දෙමින්**

**දිරිමත් කරමින්**

**මා හට නිසි මඟ පෙන්වන**

**මා දයාබර අම්මාටත් අප්පච්චිටත්**

**ආදරයෙන්**

**පුද දෙමි.**

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි. ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාල පරිච්ඡේද නිසාය. එසේනම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසැල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩනඟා එය රටේම පාසැල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාවම ඊට සම්බන්ධ කර ගැනීමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රටතුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන "හෙරණගත්කරණී" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇති කරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණකරණයට යොමු වීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නොඅනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහනුවර බාලිකා විද්‍යාලය - මහනුවර.

# පටුන


පිටුව

01. **සිව් හෙළය නොහොත් සිංහලය** 01
1.1 සිංහලය යන්න හැඳුන ආකාරය පිළිබඳව විවිධ මත 03
1.2 විජය කුමරුගේ ලංකා ගමනය 04
1.3 මිහිඳු හිමියන්ගේ ලංකාගමනය 05
1.4 සඟමිත් තෙරණිය ශ්‍රී මහා බෝධි අංකුරයක් සමඟ
මෙරටට වැඩම කරවීම. 06
1.5 බුදු දහම අප රටට ලැබීමෙන් ජන සමාජයට සිදු වූ
වෙනස්කම් 06

02. **දමිළ ජාතීන්**
2.1 ශ්‍රී ලාංකික දමිළ ජනතාව 08
2.2 කදුකර දෙමළ ජනතාව. 09

03. **මුස්ලිම් ජාතිකයින්** 10

**04. බර්ගර් ජාතිකයින්**
4.1 පෘතුග්‍රීසින්ගේ පැමිණීම (ක්‍රි.ව. 1505 -1638) 12
4.2 ලන්දේසින්ගේ පැමිණීම (ක්‍රි.ව.1638- 1796) 13
4.3 ඉංග්‍රීසින්ගේ පැමිණීම (ක්‍රි.ව. 1796- 1948) 15

05. **ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ජාතීන්** **17**
5.1 සිංහල 18
5.2 දමිළ 19
5.3 මුස්ලිම් 20
5.4 බර්ගර් 21
5.5 ආදිවාසීන් 22

06. **විවිධ ආගමික උත්සව** 24

# අපි ශ්‍රී ලාංකිකයෝ

## 01. සිව් හෙළය නොහොත් සිංහලය

ශ්‍රී ලාංකිකයන් වන අප වසර 2500ක ලිඛිත ඉතිහාසයකට උරුමකම් කියයි. විජය කුමරුගේ ලංකා ගමනයට පෙර ලංකාවේ ගෝත්‍රිකයින් වර්ග හතරක් වාසය කළ බවට ඉතිහාසයේ සඳහන් වේ. එනම්,

1. **යක්ෂ ගෝත්‍රිකයින්**
2. **රාක්ෂ ගෝත්‍රිකයින්**
3. **නාග ගෝත්‍රිකයින්**
4. **දේව ගෝත්‍රිකයන් ය.**

අපේ රට සිව්හෙළය නොහොත් සිංහලය ලෙස හැඳින්වීමට හේතුව වන්නේ මේ සිව් වර්ගයා (යක්ෂ, රාක්ෂ, නාග, දේව ගෝත්‍රිකයින්) හෙළය නොහොත් දූපත නම් මුහුදින් වට වූ ප්‍රදේශයේ ජීවත් වීමයි.

හෙළයින්ගේ ඇදහිලි පදනම් කරගෙන ඔවුන් මෙම ගෝත්‍රවලට අයත් වූ බව ජනප්‍රවාදයේ සඳහන් වේ. එනම්,

- යක්ෂයින් ඇදහුවන් යක්ෂ ගෝත්‍රිකයින් ලෙසත්,
- රාක්ෂයින් ඇදහුවන් රාක්ෂ ගෝත්‍රිකයින් ලෙසත්,
- නාගයින් ඇදහූවන් නාග ගෝත්‍රිකයින් ලෙසත්,
- දෙවියන් ඇදහූවන් දේව ගෝත්‍රිකයින් ලෙසත් ය.

එසේම ඔවුන්ගේ වෘත්තීන් පදනම් කරගෙන එක් එක් ගෝත්‍රවලට අයත් වූ බව තවත් මතයකි. එනම්,

- යක්ෂ ගෝත්‍රිකයින් කම්මල් වැඩට දක්ෂ වූ බැවින්, ඔවුන් ලෝහ කර්මාන්තයේ නිරත වූහ.
- රාක්ෂ යනු රකුස්ය. එනම් කුස රකින්නෝය. කුස රැක්කේ ගොවිතැනින් බැවින් ඔවුන් ගොවියෝ වූහ.
- නාග ගෝත්‍රිකයෝ දක්ෂ නාවිකයෝය. එසේම වාරි කර්මාන්තයේ ද, වෙළදාමේ ද දක්ෂයින් වූහ.
- දේව ගෝත්‍රිකයින් අධ්‍යාත්මික ජීවිතයක් ගෙවූ ඍෂිවරු වූහ. ළමා පරපුරට ශිල්ප ලබාදුන් ගුරුවරුන් වූයේ මොවුන්ය.

විජය කුමරුගේ ලංකා ගමනයට පෙර මෙරට විසූ සිව් හෙළයන් ඉතා දියුණු හා බුද්ධිමත් ජන කොට්ඨාසයක් බවට විවිධ සාධක පවතී. එකළ රාවණා නම් රජකු මෙරට රජ කළ බවත්, එම යුගයේ දියුණු තාක්ෂණයක් පැවති බවත්, රාවණා රජු සතුව ගුවනින් ගමන් කළ හැකි දඬුමොණරකු නම් යන්ත්‍රයක් තිබූ බවත් පුරාවෘත්තයන්හි සඳහන් වේ. “හෙළයේ ආලකමන්දාව” නමින් විරුදාවලිය ලත් සීගිරිය මුලින්ම කුවේරගේද, ඉන් පසුව රාවණා රජතුමාගේද වාසස්ථානය වී ඇත. සීගිරිය විදේශීකයින් පවා පුදුමයට පත්කළ අද්විතීය නිර්මාණයකි.

## 1.1 සිංහලය යන්න හැඳුන ආකාරය පිළිබඳව විවිධ මත

- මහා වංශයට අනුව සිංහ ලෙයින් උපන් සිංහබාහු රජුගේ පුත් විජය කුමරු මෙරට රජ පරපුරේ ආරම්භකයා වන බැවින් මෙය සිංහල දේශය බවට පත් වූ බවයි.

- ජනප්‍රවාදයට අනුව සිව් හෙළය එනම්, යක්ෂ, රාක්ෂ, නාග, දේව යන සිව් වර්ගයක ගෝත්‍රික ජනතාවක් සිටින හෙළය නොහොත් ද්වීපත යන්න සිහෙළ වී පසුව සිංහල වූ බවයි.

**සිව් හෙළ → සිහෙළ → සිංහල**

## 1.2 විජය කුමරුගේ ලංකා ගමනය

විජය කුමරු ඇතුළු පිරිස ශ්‍රී ලංකාවේ තම්මැන්නාව ප්‍රදේශයට ගොඩ බසින විට සිව්හෙළය පාලනය කළේ යක්ෂ ගෝත්‍රික නායකයින්ය. කුවේණි යනු සිව්හෙළයේ යක්ෂ පරම්පරාවට අයත් වූ කුමරියකි. කුවේණියගේ සහය ඇතිව විජය කුමරු විසින් යක්ෂ ගෝත්‍රික නායකයින් මරා දමා කුවේණිය විවාහ කරගෙන තම්මැන්නාව නම් ප්‍රදේශය අගනුවර කරගෙන රට පාලනය කළේය.

ඔවුන්ට ජීවහත්ත හා දිසාලා නමින් පුතෙකු හා දියණියක ලැබුණි. කාලයක් ගතවත්ම විජය රජතුමා පූර්ණ රාජාභිෂේක ලබා රාජ්‍යත්වයට පත් අයෙකු ලෙස පිළිගැනීමට නම් රාජකුමරියක සරණපාවා ගතයුතු බව යන මතය අනුව විජය රජු ඉන්දියාවේ රාජ කුමරියක් සරණපාවාගෙන රාජාභිෂේකය ලැබූ හෙයින් කුවේණිය තම දරු දෙදෙනා සමඟ මාලිගයෙන් පිටව ගිය බව මහා වංශයේ සඳහන් වේ.

තම නෑදෑයන්ට පිටුපා විදේශිකයින්ට රට පාවා දීම නිසා කෝපයට පත්ව සිටි යක්ෂ ගෝත්‍රිකයින් විසින් දරු දෙදෙනා සමඟ වනගත වූ කුවේණිය මරා දැමූ අතර, වනයේ අතරමං වූ දරු දෙදෙනා සමනල අඩවියට පැන ගිය බවත් ඔවුන්ගෙන් පැවතගෙන එන පිරිස ආදී වාසීන් ලෙස හැඳින්වෙන බවත් මහා වංශයේ සඳහන් වේ.

විජය කුමරුගේ අභාවයෙන් පසු ඔහුගේ සොහොයුරාගේ බාල පුතු වන පඬුවස්දෙව් කුමරු දඹදිව

සිට තවත් කුමාරවරුන් 32ක් හා පැමිණ මෙරට රජකම භාර ගත්තේය. එසේම පඬුවස්දෙව් කුමරු හා විවාහ වීමට භද්දකච්චායනා කුමරිය ද කුමාරිකාවන් 32 සමඟ පැමිණියාය. එය ශ්‍රී ලංකාවේ දෙවන රාජාභිශේකය ලෙස සඳහන් වේ.

## 1.3 මිහිඳු හිමියන්ගේ ලංකාගමනය

දෙවන පැතිස් රජ සමයේ ශ්‍රී ලංකා ඉතිහාසයේ සිදු වූ වැදගත්ම සිදුවීම වන්නේ මහා භාරතයේ අධිරාජ්‍යයා වන අශෝක රජුගේ පුත් මිහිඳු මහරහතන් වහන්සේ ප්‍රධාන ඉට්ඨිය, උත්තිය, සම්බල, භද්දසාල යන රහතන් වහන්සේලාද සුමන සාමනේරනම හා පණ්ඩුක උපාසක ඇතුළු ධර්මදූත පිරිස දහම් පණිවිඩයක් රැගෙන සිරිලකට වැඩම කිරීමයි. ඉන් අනතුරුව රාජ්‍ය අනුග්‍රහයෙන් ධර්ම ප්‍රචාරය හා ලක්දිව පුරා සම්බුද්ධ ශාසනය පැතිරිණි. බුදු දහම රාජ්‍ය ආගම බවට පත්වීමත්, ලංකාවේ රජකමට පත්වීමටනම් බෞද්ධයකු වියයුතු යැයි යන සම්ප්‍රදාය ජනතාවගේ සිත්තුල මුල් බැස ගත්තේ මෙම යුගයේය.

## 1.4 සඟමිත් තෙරණිය ශ්‍රී මහා බෝධි අංකුරයක් සමඟ මෙරටට වැඩම කරවීම.

මිහිඳු හිමිගේ නැඟණිය වන සඟමිත් තෙරණිය ජය ශ්‍රී මහා බෝධි ශාඛාව ද රැගෙන මෙරටට වැඩම කරන ලද්දේ කුල 18කට අයත් පිරිසක් ද සමඟයි. ඒ අනුව ගෘහ නිර්මාණ ශිල්පය, කැටයම් කලාව, මූර්ති චිත්‍ර මෙන්ම වෙනත් කර්මාන්ත ද අපේ රටට එකතු විය. ලංකාවේ භික්ෂුණී ශාසනය ආරම්භ වීම සංඝමිත්තා තෙරණියගේ ලංකාගමනයත් සමග සිදු වූ විශේෂ කටයුත්තකි.

## 1.5 බුදු දහම අප රටට ලැබීමෙන් ජන සමාජයට සිදු වූ වෙනස්කම්

- ✓ රාජ්‍ය පාලනය සඳහා භික්ෂූන්ගේ අවවාද අනුශාසනා ලැබීම.
- ✓ දන්ත ධාතූන්වහන්සේ සහ පාත්‍ර ධාතුව රාජ්‍ය උරුමයේ සංකේතය වීම.
- ✓ බෞද්ධ ආගම රාජ්‍ය ආගම බවට පත්වීම.
- ✓ පෙරහැර වැනි සංස්කෘතික අංග සහ වෙසක්, පොසොන් උත්සව හා බෝධිපූජා ආදිය ජන සමාජයට එක්වීම.

- ✓ භාෂාව හා සාහිත්‍ය දියුණු වීම.
- ✓ චිත්‍ර, මූර්ති කැටයම් වැනි කලාවන් බිහිවීම.
- ✓ සාහිත්‍ය ග්‍රන්ථ බිහිවීම.
- ✓ ගෘහ නිර්මාණ ශිල්පය දියුණුවීම.
- ✓ විදේශ රටවල් සමඟ සබඳතා වර්ධනය වීම.

**යක්ෂ, රාක්ෂ, නාග, දේව ගෝත්‍රවලට අයත් හෙළයන් සහ විජය කුමරුගේ ලංකාගමනයත් සමඟ මෙරටට පැමිණි ආර්යයන්, මිහිඳුහිමි සහ සංඝමිත්තා තෙරණිය සමඟ පැමිණි කුල 18කට අයත් ශිල්පීන් ඇතුළු පිරිස් ශ්‍රී ලංකාවේ පදිංචි වීමෙන් පසු මෙරට බිහි වූ ජාතිය සිංහල භාෂාව කථා කරන බෞද්ධ ආගම අදහන්නන් වූහ.**

## 02. දමිළ ජාතීන්

### I. ශ්‍රී ලාංකික දමිළ ජනතාව

මෙසේ රජවරු කිහිපදෙනෙකු විසින් දැහැමිව රට පාලනය කරගෙන යන අතරතුරු දකුණු ඉන්දීය සොලී ආක්‍රමණවලට මුහුණ දීමට අප රටට සිදු විය. ඉන්දියාවේ චෝල රටින් පැමිණි ද්‍රවිඩ රජෙකුවන එළාර රජු ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශය වසර 44ක්ම පාලනය කළේය. අද වනවිටත් ශ්‍රී ලංකාවේ උතුරු ප්‍රදේශයේ වැඩි වශයෙන් ජීවත් වන්නේ හින්දු ආගම අදහන ද්‍රවිඩ ජාතිකයින්ය. එළාර රජු ඇතුළු ඔහුගේ සොලී සේනාව පරාජය කර රට එක්සේසත් කළේ දුටු ගැමුණු රජතුමාය. දුටු ගැමුණු රජතුමා වසර 24ක් දැහැමිව රට පාලනය කළේය. අනතුරුව නැවතත් විවිධ රජවරු යටතේ සොලී අක්‍රමණ සිදු විය. ඒ අනුව පැමිණි පිරිස් දෙමළ භාෂාව කථා කරන්නන් විය. ඔවුන්ගෙන් බහුතර පිරිසක් අදටත් උතුරු පළාතේ ජීවත් වන අතර, නැගෙනහිර පළාතේ සැලකියයුතු පිරිසක් ද, බස්නාහිර පළාතේ කොළඹ පරිපාලන දිස්ත්‍රික්කයේ කොටසක් ද, අනෙකුත් ප්‍රදේශවල සුළු පිරිසක් ද ජීවත් වෙති. ඔවුන්ගෙන් වැඩි පිරිසක් හින්දු ආගම අදහන්නන් වන අතර, සුළු පිරිසක් ක්‍රිස්තියානි ආගම අදහන්නන් වේ.

ඔවුන් ලංකා සම්භවයක් සහිත දමිළ ජනයා ලෙස හඳුන්වයි.

## II. කඳුකර දෙමළ ජනතාව.

ඉංග්‍රිසීන් මෙරටට පැමිණීමෙන් පසු වාණිජ වගාවක් ලෙස තේ කර්මාන්තය දියුණු කරන ලදී. නමුත් තේ වතුවල වැඩ කිරීමට සිංහල ජනතාව අකමැති වූ බැවින් ඉන්දියාවෙන් කම්කරුවන් ගෙන ඒමට ඉංග්‍රීසීන් කටයුතු කරන ලදී. එසේ ගෙන එන ලද පිරිස් අදටත් තේ වතුවල තම ජීවනෝපාය කරගෙන ජීවත් වෙති. ඉන්දියානු සම්භවයක් සහිත ඔවුන් දෙමළ භාෂාව කථා කරන අතර, හින්දු ආගම අදහන්නන් වෙයි. ඔවුන්ගෙන් වැඩි පිරිසක් මධ්‍යම හා ඌව පළාත්වල තේ වතු ආශ්‍රිතව ජීවත් වෙති. ඔවුන් ඉන්දියානු සම්භවයක් සහිත දමිළ ජනයා ලෙස හඳුන්වයි.

## 03. මුස්ලිම් ජාතිකයන්

### I. ශ්‍රී ලංකාවේ පිහිටීම හා විදේශ වෙළඳාම

ස්වභාවික සම්පත්වලින් සපිරි අපේ රට පෙර අපරදිග මුහුදු මාර්ගයේ වැදගත් ස්ථානයක ඉන්දියානු සාගරය මධ්‍යයේ නාවික ගමන් මං හරහා පිහිටා තිබූ බැවින් වෙළඳ ගනුදෙනු වලදී වැදගත්කමක් උසුලන ලදී. මේ නිසා ඉන්දියාව, පර්සියාව මෙන්ම චීනය, බුරුමය, සුමාත්‍රා සහ රෝමය වැනි දුර ඈත රටවල් සමඟ ද අතීතයේ දී ශ්‍රී ලංකාව වෙළඳ ගනුදෙනු සිදු කර තිබේ.

විශේෂයෙන්ම හලාවත - පුත්තලම ආසන්නයේ පිහිටා ඇති මුහුදු තීරයේ ජීවත්වන මුතු බෙල්ලන්ගෙන් ලැබෙන මුතු අපරදිග රටවල් අගය කොට සලකන ලදී. එමෙන්ම කැලෑවල වැවෙන ගස්වලින් ලබා ගන්නා සුවඳ වර්ග, පොළොවෙන් ලබා ගන්නා මැණික්, කපු රෙදි, පොල් කෙඳි මගින් ලබා ගන්නා කඹ පමණක් නොව ඇත් දළ මෙන්ම අලි ඇතුන් ද විශාල වශයෙන් විදේශීය රටවල්වලට අපනයනය කරන ලදී.

අතීතයේ දී විදේශීය වෙළඳාම සඳහා උපයෝගි කරගත් නැව් තොටු කිහිපයක් මෙරට විය. එනම්, මාතොට, ඌරා තොට, දඹකොළ පටුන, ලංකා පටුන, ගෝකණ්න වරාය, තිරියාය ආදිය විය.

වෙළඳාම සඳහා අරාබියෙන් මෙරටට පැමිණි පිරිසක් ලෙස මුස්ලිම්වරු හෙවත් යෝනකයින් ද සැලකේ.

ඔවුන් ත්‍රිකුණාමලය, යාපනය, මන්නාරම, පුත්තලම, කොළඹ, බේරුවල, ගාල්ල, බෙන්තොට වැනි ප්‍රදේශවල පදිංචි වූ බව කියවේ. ඔවුන් කොළඹ සිට හම්බන්තොට දක්වා වෙළඳාමේ යෙදුනහ. ඔවුන් රජුගේ අවසරයෙන් සිංහල සහ දෙමළ කාන්තාවන් සමඟ විවාහ වී මෙරට පදිංචි වූහ. ඉස්ලාම් ආගම අදහන මෙම පිරිස් දෙමළ භාෂාව කථා කරයි.

වස්තු හිමි නොහොත් වත්හිමි නමැති සිංහල යෝනක කුමාරයකු කුරුණෑගල රාජධානිය කරගෙන දෙවන බුවනෙකබාහු නමින් ලංකාවේ රජ කළ බව ද ඉතිහාසයේ සඳහන් වේ.

## 04.බර්ගර් ජාතිකයින්

### I. පෘතුග්‍රීසීන්ගේ පැමිණීම (ක්‍රි.ව. 1505 -1638)

පෘතුග්‍රීසීන් විසින් ශ්‍රී ලංකාව සොයා ගන්නා ලද්දේ යෝනකවරුන් නිසාය. ලංකාවෙන් රැගෙන ගිය වටිනා කුළුබඩු රැගත් නැව් පසුපස පෘතුග්‍රීසීන් එළවාගෙන යාමේ දී කුණාටුවකට හසු වී පෘතුග්‍රීසී නැව් ලංකාවේ වෙරළට ගසාගෙන ඒමෙන් ඔවුන් ලංකාවට පැමිණි බව කියවේ.
ප්‍රථමවරට බටහිර ජාතියක් ලෙස පෘතුග්‍රීසීන් ශ්‍රී ලංකාවට පැමිණියේ ක්‍රි.ව. 1505 නොවැම්බර් 15 වැනි දින දීය. ශ්‍රී ලංකාවට ගොඩ බැස්ස ප්‍රථම පෘතුග්‍රීසි ජාතිකයා වන්නේ ලොරෙන්සෝ ද අල්මේදා නම් නැව් කපිතාන්වරයා ය. කපිතාන්වරයා ඇතුලු පිරිස ගොඩ බැස්සේ ගාලු තොටටයි. ඔවුන් මෙරටට පැමිණීමෙන් අපේක්ෂා කළේ පෙරදිග කුළු බඩු ඇතුළු සම්පත් ලබා ගැනීම සහ ක්‍රිස්තියානි ආගම පැතිරවීමත්ය. ඒ අනුව මෙහි පැමිණි කතෝලික පූජකවරු සිංහල හා දෙමළ භාෂාව ඉගෙනගෙන කතෝලික ආගම ගැන පොත් පත් ලිවූහ. ඒ අනුව වෙරළබඩ ජනතාව පහසුවෙන් කතෝලික ආගම වැළඳ ගත්හ. අදටත් ශ්‍රී ලංකාවේ වෙරළබඩ ප්‍රදේශවල ජීවත් වන වැඩි පිරිසක් කතෝලික ආගම අදහන්නන් වේ.
එසේම ලංකාවේ ජීවත්වන බර්ගර් ජාතිකයින් වැඩි පිරිසක් පෘතුග්‍රීසින්ගෙන් පැවත එන්නන් වේ.

එමෙන්ම පෘතුග්‍රීසි වචන රාශියක්ද අපේ භාෂාවට එකතු වූ අතර ඒවා අදටත් අප අතර භාවිතා වේ. එනම්,

- **ආහාර වර්ග - පාන්, අච්චාරු, පීකුදු, දෝසි, පස්තෑල, විස්කෝතු, ලිංගුස්, සලාද,වයින්**
- **පළතුරු - කජු, පැපොල්, පේර, අනෝදා, අන්නාසි**
- **ඇඳුම් - කමිස, කලිසම්, ලේන්සු, කබා, සාය, කබාකුරුත්තු, සපත්තු, මේස්, බොත්තම්**
- **ලී බඩු - අල්මාරි, ගුදිරි, බංකු, මේස, ගරාදි, ලීස්තර**
- **නීතිය හා පාලනය - මිනිදෝරු, මුද්දර, පෙරකදෝරු, අලුගෝසු**
- **පෞද්ගලික පෙළපත් නාම - කැතරින්,පෙරෙයිරා, ජෝන්, සිල්වා, මෙන්ඩිස්, වාස්, අල්මේදා**
- **ගීත - බයිලා, කපිරිඤ්ඤා,**

## II. ලන්දේසින්ගේ පැමිණීම (ක්‍රි.ව.1638- 1796)

එකල කන්ද උඩරට රජකළ කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් පෘතුග්‍රීසීන් මෙරටින් එළවීම සඳහා ලන්දේසීන්ගේ සහය පැතීය. නමුත් 1760න් පසු රජු සහ ලන්දේසින් අතර ගැටුම් උග්‍ර විය. ඒ අනුව 1766 දී රජතුමාට අවාසිදායක ගිවිසුමකට එළඹීමට සිදු විය. එහිදී කීර්ති ශ්‍රී රාජසිංහ රජතුමා විසින් දිවයින වටා මුහුදු වෙරළේ සිට සැතපුමක් අයිතිය ලන්දේසින්ට පැවරුවේය. ඒ අනුව උඩරට විදේශීය වෙළදාම සම්පූර්ණයෙන්ම ලන්දේසීන්ට පැවරුණු අතර, උඩරටට අවශ්‍ය ලුණු පවා

ලන්දේසීන්ගෙන් මුදල් ගෙවා ලබා ගැනීමට සිදුවිය. එයට අදටත් ගැමි වහරේදී ප්‍රස්තා පිරුළක් ලෙස "ඉඟුරු දී මිරිස් ගත්තා"යැයි භාවිත වේ.

අදටත් ශ්‍රී ලංකාවේ භාවිතා වන්නේ රෝම ලන්දේසි නීතියයි. පෘතුගීසින් මෙන් නොව ලන්දේසීන් කෘෂිකර්මය දියුණු කිරීමට දැඩි උනන්දුවක් දක්වන ලදී. කුරුඳු වගාව, වී ගොවිතැන මෙන්ම ගම්මිරිස්, කෝපි, පොල් හා පුවක් වගාවන් ද දියුණු කරන ලදී. එසේම ගෘහ නිර්මාණ ශිල්පය හා ගෘහ භාණ්ඩ ශිල්පය ද දියුණු කරන ලදී.

ලන්දේසීන් කතෝලික ආගම මුලිනුපුටා දමා රෙපරමාදු ක්‍රිස්තියානි ධර්මය මෙරට ප්‍රචලිත කිරීමට උත්සාහ ගන්නා ලදී.

පෘතුග්‍රීසීන්ගෙන් මෙන්ම ලන්දේසීන්ගෙන්ද අපේ ව්‍යවහාරයට වචන බොහොමයක් එක් වුණි. එනම්,

- **ගෘහ නිර්මාණය - ඉස්තෝප්පුව, සොල්දරය, තරප්පුව, කුළුණ**
- **ගෘහ භාණ්ඩ - ඉස්කිරිම, කනප්පුව, රාක්කය, ඔරලෝසුව, පෙට්ටගම**
- **ගෘහ උපකරණ - ලන්තෑරුම, ලාම්පුව, පෝච්චිය, කේතලය**
- **එළවළු/ පළතුරු - අර්තාපල්, සැල්දරි, බෝංචි**
- **ආහාර වර්ග - කොකිස්**
- **සූදු කෙළිය - ඉස්කෝප්ප, තුරුම්පුව, කලාබර**

- **නීතිය සම්බන්ධ වචන - පොල්මංකාරයා, අද්මිනිස්ත්‍රාත්කාර, රෙගුලාසි**
- **පෞද්ගලික හා පෙළපත් නාම - ජාකොබ්, පිලිප්ස්, කොර්නේලිස්, කරෝලිස්, හරමානිස්, ගිරිගෝරිස්, තෙපානිස්, කොරනේලියා, ජොහානා**

## III. ඉංග්‍රීසීන්ගේ පැමිණීම (ක්‍රි.ව. 1796- 1948)

ක්‍රි.ව. 1796 දී බ්‍රිතාන්‍ය ජාතිකයින් ලන්දේසීන්ගෙන් ශ්‍රී ලංකාවේ මුහුදුබඩ පළාත් පවරා ගන්නා ලදී. ඉන් පසු 1815 මාර්තු 02 වන දා උඩරට රදළ ප්‍රධානීන් හා එවකට ලංකාවේ ආණ්ඩුකාර රොබට් බ්‍රවුන්රිග් අතර මහනුවර මඟුල් මඩුවේදී ඇති වූ ගිවිසුමෙන් පසු දිවයිනේ සම්පූර්ණ බලය බ්‍රිතාන්‍යන් සතු විය.

ඉංග්‍රීසීන් වඩාත්ම ලංකාව කෙරෙහි උනන්දු වූයේ කුරුඳු වැනි වාණිජ වගාවන් හා ත්‍රිකුණාමලය ස්වභාවික වරාය වැදගත්කම නිසයි.

බ්‍රිතාන්‍යයන් මෙරට මහා මාර්ග සහ දුම්රිය මාර්ග දියුණු කිරීමට පියවර ගන්නා ලදි. වැවිලි කර්මාන්තයේ දියුණුවත් සමඟ කුරුඳු, කෝපි, කපු සහ තේ වගාව ද ආරම්භ කිරීමත් සමඟම ඒවා ප්‍රවාහනය සඳහා මහා මාර්ග මෙන්ම දුම්රිය මාර්ග ද ඉදි කිරීමට පියවර ගත්හ. මාර්ග සංවර්ධනය වීමත් සමගම අප රටේ ආර්ථික, සාමාජීය හා සංස්කෘතික

දියුණුවක් ඇති විය. ඉංග්‍රිසි අධ්‍යාපනය මෙරට ප්‍රචලිත කිරීමට ද කටයුතු කරන ලදී.

ඉංග්‍රීසින් මෙරට තේ වගාව ආරම්භ කළ අතර තේ වතුවල වැඩ කිරීමට සිංහලයින් අකමැති වූ බැවින් දකුණු ඉන්දියාවෙන් ද්‍රවිඩ ජාතිකයින් මෙරටට ගෙන එන ලදී. අදටත් තේ වතුවල වැඩ කරනු ලබන්නේ ඉන්දියානු ද්‍රවිඩ ජාතීන්ය.

- **1833 දී ශ්‍රේෂ්ඨාධිකරණය තීන්දුවක් නිකුත් කළේ**

> **“පෘතුග්‍රීසී හා ලන්දේසී ජාතිකයන්ගෙන් පැවත එන්නන් සහ යුරෝපීය ජාතිකයන්ට දාව ලංකාවේදී උපත ලබන සියළුම දෙනා මින් පසු බර්ගර්වරුන් ලෙස හඳුන්වන බවයි.”**

## ශ්‍රී ලංකාවේ ජීවත්වන විවිධ ජාතීන්

- ශ්‍රී ලංකාව බහු ජාතික, බහු ආගමික, බහු සංස්කෘතියක් සහිත පිරිසක් ජීවත්වන සුන්දර රටකි.

- ශ්‍රී ලංකාවේ වෙසෙන සියලු ම ජාතීන් පොදුවේ ශ්‍රී ලාංකිකයන් ලෙස හඳුන්වයි.

- එහෙත් ඔවුන් කථා කරන භාෂාව, ගන්නා ආහාර, අඳින පළඳින දෑ සහ අදහන ආගම අනුව ඔවුන් එකිනෙකාට වෙනස් වේ.

ඒ අනුව ඔවුන්,

1. සිංහල
2. දමිළ
3. මුස්ලිම්
4. බර්ගර්
5. ආදි වාසීන් වේ.

<u>**සිංහල**</u>

- **ආහාර -:** බත්, කිරි බත්,අතිරස, මුං කැවුම්, අග්ගලා, ආස්මී
- **පාන වර්ග -:** රණවරා, බෙලිමල්, කොළකැඳ
- **ඇඳුම් -:** නිළමේ ඇඳුම, ඔසරිය, ළමා සාරිය, ආරිය සිංහල ඇඳුම සහ ආභරණ
- **චාරිත්‍ර -:** සිංහල අවුරුදු චාරිත්‍ර
- **ආචාර විදි -:** දෑත් එක්කොට " ආයුබෝවන්" කීම.
- **කතා බහ -:** සිංහල භාෂාව
- **අදහන ආගම් -:** බෞද්ධ, කතෝලික, ක්‍රිස්තියානි
- **ජන සංයුතිය -:** 74.9%



# <u>දමිළ</u>

- **ආහාර -:** පොංගල් සෝරු, ලඩ්ඩු, වඩේ, මුරුක්කු, තෝසේ, සාම්බාරු
- **පාන වර්ග -:** කෝපි, තේ, රසම්, එළකිරි
- **ඇඳුම් -:** සරම, වේට්ටිය, බැනියම, ඉන්දියානු සාරිය, සාය, හැට්ට සහ ආභරණ, කාන්තාවන් හිසෙහි මල් දැවටීම.
- **චාරිත්‍ර -:** සූර්යය මංගල්‍ය, පූන නූල පැළඳීම.
- **ආචාර විදි -:** " වණක්කම්" කියා ආචාර කිරීම.
- **කතා බහ -:** දෙමළ භාෂාව
- **අදහන ආගම් -:** හින්දු, බෞද්ධ, ක්‍රිස්තියානි, කතෝලික
- **ජන සංයුතිය -:**
    1. ශ්‍රී ලාංකික ද්‍රවිඩ -: 11.15%
    2. ඉන්දියානු ද්‍රවිඩ -: 4.12%



<u>**මුස්ලිම්**</u>

- **ආහාර -:** බිරියානි, වටලප්පන්, රට ඉදි, මස්කට්, බූන්දි
- **පාන වර්ග -:** සව්, සරුවත්, මස් කැඳ, ෆලූඩා
- **ඇඳුම් -:** හිජාබ්, පර්දාව, බුර්කාව, හබාය, ජුබ්බා සහ තොප්පිය
- **චාරිත්‍ර -:**සෑම සිකුරාදාම මස්ජිදයට යාම. දිනකට පස්වරක් ආගම ඇදහීම.
- **ආචාර විදි -:** අස්ලාම් අලෛකුම්, අලෛක්කම් අස්ලාම්
- **කතා බහ -:** දෙමළ භාෂාව
- **අදහන ආගම -:** ඉස්ලාම්
- **ජන සංයුතිය -:** 9.3%



<u>බර්ගර්</u>

- **ආහාර -:** කේක්, පාන්, රොටි,පි ට්සා, රෝල්ස්, පැටිස්,
- **පාන වර්ග -:** වයින් සහ පළතුරු බීම
- **ඇඳුම් -:** කලිසම්, කමිස, කොට්, ටයි පටි, බෝ, සාය, බ්ලව්ස්, ඔරලෝසු
- **චාරිත්‍ර -:**සෑම ඉරිදාම පල්ලියට යාම.
- **ආචාර විදි -:** අතට අත දීම.
- **කතා බහ -:** ඉංග්‍රීසි භාෂාව
- **අදහන ආගම් -:** රෙපරමාදු ක්‍රිස්තියානි, කතෝලික
- **ජන සංයුතිය -:** 0.19%



**බර්ගර් ජාතිකයින් ප්‍රධාන වර්ග 2කි.**

1. පෘතුග්‍රීසි බර්ගර්
   පෘතුග්‍රිසි සම්භවයක් සහිත බර්ගර් වරුන් වේ. ඔවුන් මඩකලපුව, අම්පාර, ත්‍රිකුණාමලය ප්‍රදේශවල ජීවත් වෙති.

2. ඕලන්ද බර්ගර්
   මොවුන් ලන්දේසි සම්භවයක් සහිත පිරිසකි.

## <u>ආදි වාසීන්/ වැදි ජනයා</u>

- **ආහාර -:** දඩ මස්, මී පැණි, පළතුරු, අල වර්ග
- **පාන වර්ග -:** වතුර
- **ඇඳුම් -:** කොළ අතු, සතුන්ගේ හම්, වර්තමානයේ රෙදි
- **චාරිත්‍ර -:** කිරිකොරහ නැටීම , නෑ යකුන් පිදීම, ගස් ගල්වලට වැදීම
- **කතා බහ -:** වැදි භාෂාව
- **ජීවත්වෙන ප්‍රදේශ -:** දඹාන, රතුගල,නිල්ගල, දිඹුලාගල, බින්තැන්න,
- **වරිග නාම -**: මොරාන වරුගේ, උනාපාත වරුගේ, ඌරු වරුගේ, ඇඹල වරුගේ, නමුඩන වරුගේ, තලා වරුගේ

වැදි ජනයා වර්ග කිහිපයකට අයත්ය. එනම්,

1. **නිරි වැද්දන්**

   ගස් බෙන, ගස් මණ්ඩි අතර වාසය කරමින් ගස් පොතු, අතු වලින් විලිවසා ගෙන සිටී.

2. **ගල් වැද්දන්**

   ආහාර රැස් කර ගල් ගුහා හා ගල් තලාවල ජීවත්වෙන දක්ෂ දඩයම්කරුවන්ය. සිරුර වසා ගැනීමට කොළ අතු භාවිතා කළෝය.

3. **ගම් වැද්දෝ**

   ගම්මානයට සමීපව ගොවිතැන් කරමින් කැලෑ සීමාවේ අතු සෙවිලි කළ වහල සහිත කටුමැටි නිවාස තනාගෙන ජීවත් වූහ. විලිවසා ගැනීමට රෙදි කඩක් භාවිතා කළහ.

4. **වෙරළබඩ වැද්දෝ**

   මසුන් ඇල්ලිම මඟින් ආහාර ලබා ගන්නා අතර, මුහුදු වෙරළේම කලපුවලට සමීපව ජීවත් වෙයි. විලිවසා ගැනීමට රෙදි කඩක් භාවිතා කළහ. මොවුන් දමිළ බස කතා කරයි.

# .විවිධ ආගමික උත්සව

| අංකය | ආගම | ආගමික ස්ථානය | උත්සවය | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|---|
| 01 | **බෞද්ධාගම**<br><br>ආගමික ග්‍රන්ථය- ත්‍රිපිටකය<br><br>ආගමික සංකේතය - ධර්ම චක්‍රය | **පන්සල** | **වෙසක් උත්සවය**<br><br>මැයි මාසයේ පවත්වයි. | සිදුහත් කුමරාගේ උපත, බෝසතාණන් වහන්සේගේ බුදුවීම, ගෞතම බුදු රජාණන් වහන්සේගේ පිරිනිවන් පෑම යන තෙමඟුල සිහිපත් කිරීම. |
| | | | **පොසොන් උත්සවය/ මිහිඳු පෙරහැර**<br><br>ජූනි මාසයේ පවත්වයි. | මිහිඳු මහරහතන් වහන්සේ දඹදිව සිට මෙරටට වැඩම කළ දිනය සිහිපත් කිරීම. |
| | | | **ඇසළ උත්සවය**<br><br>ජූලි මාසයේ පවත්වයි. | සිදුහත් කුමරු මව්කුස පිලිසිඳ ගැනීම, බෝසතුන්ගේ මහාභිනිශ්ක්‍රමණය, බුදු රදුන්ගේ ප්‍රථම ධර්ම දේශනය දම්සක් පැවතුම් සූත්‍රය පැවැත්වීම, මහනුවර දළදා පෙරහැර පැවැත්වීම. |

| අංකය | ආගම | ආගමික ස්ථානය | උත්සවය | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|---|
| 02 | **හින්දු ආගම**<br><br>ආගමික ග්‍රන්ථය- භගවද්- ගීතාව<br><br>ආගමික සංකේතය - ත්‍රිශූලය | **කෝවිල** | **තෛපොන්ගල් උත්සවය**<br><br>ජනවාරි මාසයේ පත්වයි. | අස්වැන්න නෙලීමේ උත්සවයයි. හිරු දෙවියන්ට අලුත් සහලින් කිරිබත් පූජා කරයි. |
| | | | **දීපවාලි උත්සවය**<br><br>ඔක්තොම්බර් හෝ නොවැම්බර් මාසයේ පවත්වයි. | ආලෝකයේ උත්සවයයි. සිතෙහි පවතින අඳුර දුරු කර ආලෝකය ඇතිකර ගැනීම. |
| | | | **මහා ශිව රාත්‍රී උත්සවය**<br><br>පෙබරවාරි මාසයේ පවත්වයි. | නව රාත්‍රී දේව පූජාව |
| | | | **වේල් උත්සවය**<br><br>ජූලි හා අගෝස්තු මාස අතර පවත්වයි. | කඳ සුරිඳු උදෙසා උපහාර පිදීම. |

| අංකය | ආගම | ආගමික ස්ථානය | උත්සවය | පැවැත්වීමේ අරමුණ |
|---|---|---|---|---|
| 03 | **ක්‍රිස්තියානි ආගම**<br><br>ආගමික ග්‍රන්ථය- ශුද්ධ බයිබලය<br><br>ආගමික සංකේතය - කුරුසිය | **පල්ලිය (දේවස්ථානය)** | **නත්තල් උත්සවය**<br><br>දෙසැම්බර් 25 | ජේසු බිලිදුන්ගේ උපත සිහිපත් කරයි. |
| | | | **මහ සිකුරාදා**<br><br>අප්‍රේල් | ජේසුස් වහන්සේගේ කුරුසපත්වීම සිහිපත් කරයි. |
| | | | **පාස්කු ඉරිදා**<br>අප්‍රේල් | ජේසුස් වහන්සේගේ උත්ථානය සිහිපත් කරයි. |
| 04 | **ඉස්ලාම් ආගම**<br><br>ආගමික ග්‍රන්ථය- අල් කුරාණය<br><br>ආගමික සංකේතය - අඩ සඳ සහ තරුව | **මස්ජිදය** | **රාමසාන් උත්සවය**<br><br>සැප්තැම්බර් මසයේ පවත්වයි. | අල් කුරාණය පිළිබඳ මුහම්මද්තුමන්ට මූලික හෙළිදරව් කිරීම් ලැබුන මාසය ලෙස සලකා සමරයි. පුරා මාසයක් දිවා කාලයේ උපවාසයේ යෙදෙයි. |
| | | | **හජ්ජි උත්සවය**<br><br>ජූනි මාසයේ පවත්වයි. | මනුෂ්‍යත්වයේ පරිත්‍යාග ගුණය සිහිපත් කරයි. මක්කම වන්දනාවේ යෙදෙයි. |

## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍ය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විහවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩනගා ගැනීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පැසැල් දරුවන් ග්‍රන්ථකරණයට යොමු කරන ක්‍රියා මූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැටදහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළු ලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි.පාසලක් මුල් වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුයි.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින් ලබා දිය නොහැකිය. මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මකබවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටළු ප්‍රශ්න නිර්මාණය වීමට හේතුවී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාමක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමඟ ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසැල් දරුවන් සමඟ එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙන යාමට මහාමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනඟා දී තිබේ. තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛණ දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,
සෙනවිරත්න මහලේකම්